## “තිරසර කෘෂි වැඩසටහන Farming System Sustainability Programme (FSSP) – කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය”

කෘෂි ව්‍යාපෘති සඳහා වන ප්‍රවේශය ඉහළ නැංවීම අරමුණු කරගත් තිරසර කෘෂි වැඩසටහන (FSSP) - කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය 2026 වසරේ සිට වාර්ෂික වැඩසටහනක් ලෙස දිවයින පුරා ක්‍රියාත්මක වේ.

මෙම ණය යෝජනා ක්‍රමය මඟින් කෘෂි අගයදාම හා සම්බන්ධ ව්‍යාපෘති සඳහා ණය මුදල් සැපයීම සිදුකරන අතර ජාතික ආර්ථිකයට ප්‍රසාරණාත්මක බලපෑමක් ඇති කරන ව්‍යාපෘති කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීමට අරමුණු කර ඇත. ප්‍රතිලාභීන් තෝරා ගැනීමේදී කෘෂි අගයදාම හා සම්බන්ධ ව්‍යාපෘතිවල තිරසරභාවය, ඵලදායිතාව, අලෙවි විභවය, අපනයන විභවය, පාරිසරික හානි අවම වීම, ඍජු හා වක්‍ර රැකියා උත්පාදනය ආදිය සළකා බලනු ලබයි.

ව්‍යාපෘති ක්ෂේත්‍ර/අංශ - කෘෂිකර්මාන්තය ආශ්‍රිත වගාවන් (තේ, පොල්. රබර් වගා කිරීම හැර), කෘෂිකාර්මික උපකරණ හා යන්ත්‍රෝපකරණ මිළදී ගැනීම, ආහාර සැකසීම, කෘෂිකර්මාන්තයේ හරිත තාක්ෂණය භාවිතය, අපනයනය අරමුණු කරගත් කුඩා හා මධ්‍ය පරිමාණ කෘෂි කර්මාන්ත හා ව්‍යාපාර, කෘෂිකර්මාන්තය පදනම් කරගත් කර්මාන්ත, කෘෂිකාර්මික අගය එකතු කළ කර්මාන්ත (තේ, පොල්. රබර් ඇතුළුව), පශු සම්පත් සංවර්ධනය, මිරිදිය ධීවර කර්මාන්තය, කෘෂිකර්මාන්තය පාදක කර ගත් නවෝත්පාදන නිෂ්පාදන, ක්ෂේත්‍රයට අදාළ වාණිජ වාහන හා ඉඩම් වාහන මිළට ගැනීම, කෘෂි අමුද්‍රව්‍ය (කෘෂි නිෂ්පාදනවල ඵලදායීතාව ඉහළ නැංවීමට යොදා ගන්නා අමුද්‍රව්‍ය ආශ්‍රිත ව්‍යාපාර වන අතර මෙය ප්‍රධාන ව්‍යාපාරය විය යුතුයි), කෘෂිකාර්මික පහසුකම් සපයන්නන් හා ගැණුම්කරුවන්, කෘෂිකාර්මික සංචාරක ව්‍යාපාර, මල් වගා කිරීම, බිම්මල් වගාව ඇතුළු කෘෂි අගයදාම සම්බන්ධ ඕනෑම ක්ෂේත්‍රයක දැනට කරගෙන යනු ලබන කෘෂි ව්‍යාපාර වැඩි දියුණු කිරීමට හා නව ව්‍යාපාර ආරම්භ කිරීමට, කාරක ප්‍රාග්ධන, ආයෝජන සහ ඒකාබද්ධ (කාරක ප්‍රාග්ධන සහ ආයෝජන ඒකාබද්ධව) ණය ලබා ගැනීමේ අරමුණින් අයදුම් කළ හැක

ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරන බැංකු - මහජන බැංකුව, ලංකා බැංකුව (BOC), ප්‍රාදේශීය සංවර්ධන බැංකුව (RDB), කොමර්ෂල් බැංකුව, හැටන් නැෂනල් බැංකුව (HNB), DFCC බැංකුව, කාගිල්ස් බැංකුව, සණස සංවර්ධන බැංකුව (SDB), සෙලාන් බැංකුව, සම්පත් බැංකුව, නේෂන්ස් ට්‍රස්ට් බැංකුව (Nations Trust Bank), පෑන් ඒෂියා බැංකුව (Pan Asia Bank), රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව (SMIB), යූනියන් බැංකුව (Union Bank)

ප්‍රතිලාභීන්ගේ වයස් කාණ්ඩය - අවුරුදු 18 – 65 අතර

උපරිම ණය සීමාව - තනි පුද්ගල ණය සීමාව උපරිම රුපියල් මිලියන 05කි.
තොග ණය සඳහා අදාළ ව්‍යාපෘතිය මත සහ ප්‍රතිලාභී සංඛ්‍යාව මත වෙනස් වේ.
(එක් ප්‍රතිලාභියෙකු සඳහා උපරිමය රු.500,000.00කි)

පොලී අනුපාතය - වාර්ෂිකව 5%

ණය ගෙවීමේ කාලය -

I. තනි පුද්ගල ණය -කාරක ප්‍රාග්ධන ණය සඳහා සහන කාලය ද ඇතුළුව උපරිම අවුරුදු 3ක් සහ ආයෝජන ණය සහ ඒකාබද්ධ ණය සඳහා සහන කාලය ද ඇතුළුව උපරිම අවුරුදු 5කි

II. තොග ණය - සහන කාලය ද ඇතුළුව උපරිම වසර 03කි.

සහන කාලය - තනි පුද්ගල - ව්‍යාපෘතියේ ස්වභාවය අනුව උපරිම මාස 12කි./තොග ණය - ව්‍යාපෘතියේ ස්වභාවය අනුව උපරිම මාස 06කි.

වැඩිදුර පැහැදිලි කිරීම් සඳහා - අධ්‍යක්ෂ (කෘෂි ව්‍යාපාර) – 011 2034300 (දිගු අංකය 4323/4511)

ලේකම් කාර්යාලය දුරකථන தொலைபேசி Telephone - 011-2034301 පොදු දුරකථන தொலைபேசி Telephone - 011-2034300
செயலாளர் அலுவலகம் ඊ-මේල් மின்னஞ்சல் e- mail - secretary@agrimin.gov.lk பொது ඊ-මේල් மின்னஞ்சல் e- mail -info@agrimin.gov.lk
Secretary Office ෆැක්ස් தொலைநகல் Fax - 011-2863497 General ෆැක්ස් தொலைநகல் Fax - 011-2868910
පිළිතුරු ලිපි යොමු කිරීමේදී මගේ අංකය, ලිපි කවරයේ වම්පස ඉහළ කෙලවරෙහි සඳහන් කර එවීමට කාරුණික වන්න

බාගත කරන්න

- ණය අයදුම්පත්
  පුද්ගලික ණය අයදුම්පත 01 – (රු. 1,000,000.00ට වඩා අඩු )
  පුද්ගලික ණය අයදුම්පත 02 – (රු.1,000,000.00 සිට රු.5,000,000.00 දක්වා)
  තොග ණය අයදුම්පත 03

- ව්‍යාපාර සැලැස්ම
  ව්‍යාපාර සැලසුම 01 (රු.500,000.00ට අඩු)
  ව්‍යාපාර සැලසුම 02 (රු.500,000.00 සිට රු.2,500,000.00 දක්වා)
  ව්‍යාපාර සැලසුම 03 (රු. 2,500,000.00ට වැඩි - රු.5,000,000.00 දක්වා)
  (තොග ණය - තනි පුද්ගල සැලසුම)

- ණය අයදුම්කරුට උපදෙස්